## *2009 වර්ෂය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ පාලන වාර්තාව*

1. **හැඳින්වීම:**

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ මෙහෙයවීම සහ මාර්ගෝපදේශකත්වය යටතේ සුරාබදු දෙපාර්තමේන්තුවට, රජයේ ප්‍රතිපත්ති හා ඒවාට අදාල සුරාබදු ආදායම් සුරැකීම හා එකතු කිරීම ඇතුළු කටයුතු සඳහා නෛතික අධිකාරය ලැබෙන්නේ ප්‍රධාන වශයෙන්ම ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වෙනි අධිකාරිය වන සුරාබදු ආඥා පණතෙනි. මේ හැරුණු විට, 1999 අංක 8 දරණ දුම්කොළ බදු පණතෙහි අධිකාරිය පවත්වා ගැනීමේ වගකීම හා පොලිස් හා වෙනත් අදාල නියෝජිතායතනයන් සමග, වස, විෂ, අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණතෙහි අධිකාරිය බලාත්මක කිරීමේ සාමූහික වගකීමද, 2006 අංක 27 දරණ දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම ද, දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනිවාර්ය කාර්යයෝ ය. පූර්වෝක්ත ආඥා පණත් හා පණත්වල සහ ඒවාට අනුසාංගික නීති, රෙගුලාසි, නිවේදන, නියෝග හා විධාන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ බලධාරී ප්‍රධාන පෙලේ නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. රටේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා වැය කිරීමට සැලකිය යුතු අය සම්භාරයක් රැස්කර දීමෙන් හා එකී ව්‍යවස්ථාවන් යටතේ ගැනෙන සැම ආකාරයකම වැරදි වැලක්වීමෙන් හා ග්‍රහණය කිරීම තුලින් සමාජ ආරක්ෂාව සැලසීමෙහි සුවිශේෂ ජාතික මෙහෙවරක් ඉටු කිරීමේ කාර්යයක සුරාබදු දෙපාර්තමේන්තුව නිරත වෙයි.

2. **ඉදිරි දැක්ම**

ශ්‍රී ලංකාවේ, නීත්‍යානුකූල නොවන මත්පැන් හා මත්ද්‍රව්‍ය වලින් තොර සමාජයක් ගොඩනැගීමට දායක වීම.

3. **මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සුරා හා දුම්කොළ කර්මාන්තයන්හි කාර්යක්ෂම පාලනයක් තුලින් ආදායම එකතු කිරීමෙනුත්, මෙකී කර්මාන්තවල නීත්‍යානුකූල නොවන නිෂ්පාදනයන් වැලැක්වීමෙන්, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට හා සමාජ සුභ සාධනයට දායකවීමත්, වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආරක්ෂාව ලබා දීමත් ය.

**පරමාර්ථයන් :**

අ. මත්පැන් හා දුම්කොළ වලින් ලැබෙන ආදායම ආරක්ෂා කර ගැනීම.
ආ. සුරාබදු ආඥා පණත හා දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඇ. වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීම.
ඈ. දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම.

**ක්‍රියාකාරකම් :**

අ. බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය , පාලනය හා ඒවායින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.
ආ. සුරාබදු ආඥා පණත සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම.
ඇ. දුම්කොළ නිෂ්පාදනාගාර අධීක්ෂණය හා පාලනය ඇතුළුව දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඈ. වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම
ඉ. දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම

4. **සංවිධාන ව්‍යුහය**

2009.12.31 වන දිනට කාර්ය මණ්ඩලය මෙසේ විය:-

| | | |
|---|---|---|
| සුරාබදු කොමසාරිස් ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (ආදායම්) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (පාලන/මානව සම්පත්) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අභ්‍යන්තර විගණන) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| සහකාර සුරාබදු කොමසාරිස් | : | 12 |
| පරිපාලන නිලධාරී | : | 02 |
| සුරාබදු අධිකාරී | : | 14 |
| ප්‍රධාන සුරාබදු පරීක්ෂක | : | 24 |
| සුරාබදු පරීක්ෂක | : | 271 |
| සුරාබදු සැරයන් මේජර් | : | 14 |
| සුරාබදු සැරයන් | : | 67 |
| සුරාබදු නියාමක / කෝප්‍රල් | : | 432 |
| සුරාබදු රියදුරු | : | 58 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | : | 88 |
| අයවැය සහකාර | : | 01 |
| කාර්යාල සේවක සේවය | : | 38 |
| බංගලා භාරකරු | : | 03 |

5. **මාණ්ඩලික වෙනස්කම්:**

- ශ්‍රී.ලං.ග.සේ I, කේ.ඩී.ජේ ද ලසාල් මහතා 2009.05.11 වන දින සිට ස්ථාන මාරුවී ගිය අතර, ඒ වෙනුවට ශ්‍රී.ලං.ග.සේ I ඩී.එම්.වී දිසානායක මෙනවිය ස්ථාන මාරු ලැබ පැමිණියාය.

- ශ්‍රී.ලං.ග.සේ II/I එස්.ඩී ශ්‍රියාලතා මහත්මිය ස්ථාන මාරුවී ගිය අතර, ඒ වෙනුවට ශ්‍රී.ලං.ග.සේ II/II ජේ.ඒ. අජිත් ප්‍රියන්ත මහතා ස්ථාන මාරු ලැබ පැමිණියේ ය.

- ශ්‍රී.ලං.ප.සේ III, එම්.එම් විජයසේන මහතා 2009.02.17 වන දින සිට ස්ථාන මාරුවී ගිය අතර, ඒ වෙනුවට ශ්‍රී.ලං.ප.සේ III, ඩබ්. විතානගේ මහතා ස්ථාන මාරු ලැබ පැමිණියේ ය.

- ශ්‍රී.ලං.ග.සේ 1, සී. ජයරත්න මහතා 2009.07.01 වන දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රම ගිය අතර, ඒ වෙනුවට ශ්‍රී.ලං.ග.සේ II/I ඒ.එන් හපුගල මහතා ස්ථාන මාරු ලැබ පැමිණියේ ය.

- පරිපාලන නිලධාරී යූ.එච්.එන්.පී උණගල්ල මහතා 2009.10.22 වන දින සිට ස්ථාන මාරු ලැබ පැමිණියේ ය.

- 2009 වර්ෂය තුලදී පහත නම් සඳහන් නිලධාරීන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී

| නිලධාරියාගේ නම | තනතුර | විශ්‍රාම ගත් දිනය |
|---|---|---|
| ජේ.කේ.එම්.ජේ බණ්ඩාර මහතා | සුරාබදු පරීක්ෂක | 2009.06.19 |
| කේ. රාමචන්ද්‍රන් මහතා | සුරාබදු පරීක්ෂක | 2009.12.16 |

- සුරාබදු පරීක්ෂක, එන්. ශ්‍රීකාන්තන් මහතා 2009.03.27 වන දින, හදිසි අනතුරකින් මියයන ලදි.